## අධ්‍යාපනය හා දැනුවත්භාවය

- ආපදා කළමනාකරණය පාසල් විෂය මාලාවට ඇතුල් කිරීම
- පාසල් සිසුන්ට කියවීම සඳහා විවිධ උපද්‍රව පිළිබඳ අතිරේක ප්‍රකාශන සංවර්ධනය කොට බෙදා හැරීම
- රාජ්‍ය ආයතන සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම
- සියලු ආපදාවලින් මිය ගිය අය අනුස්මරණය කරනු පිණිස වාර්ෂික සුරක්ෂිත දින වැඩසටහන සංවිධානය කිරීම හා ශ්‍රී ලාංකිකයන් අතර සුරක්ෂිත සංස්කෘතියක් බිහි කිරීම
- තෘතියික අධ්‍යාපන පද්ධතියට ආපදා ප්‍රතිචාර සංකල්ප හඳුන්වා දීම
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන සම්පත් මධ්‍යස්ථානයට ආපදා කළමනාකරණ ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන ලබා දීම.
- ආපදා කළමනාකරණයෙහි නියැලි සියලු පාර්ශ්වයන්හි කටයුතු සම්බන්ධීකරණය හා නිරීක්ෂණය කිරීමේ ජාතික වේදිකාව ලෙස ජාතික ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ කමිටුව පිහිටවීම.

## පූර්ව අනතුරු ඇඟවීම

- ජාතික හා ජාත්‍යන්තර පූර්ව අනතුරු ඇඟවීම් ආයතන සමඟ සම්බන්ධීකණයෙන් අඛණ්ඩව ආපදා පිළිබඳ තොරතුරු ලබාගැනීම..
- ප්‍රජාව ඉවත් කිරීමට අවශ්‍ය පූර්ව අනතුරු ඇඟවීම් පණිවිඩ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පතුරුවා ලීම.
- පූර්ව අනතුරු ඇඟවීම් පණිවිඩ පතුරුවාලනු පිණිස පූර්ව අනතුරු ඇඟවීම් කුළුණු 77ක්, ඉතා අධි සංඛ්‍යාත/ අධි සංඛ්‍යාත (වී.එච්.එෆ්./ එච්.එෆ්.) ගුවන් විදුලි සන්නිවේදන පද්ධතිය, ජංගම දුරකථන, විද්‍යුත් මාධ්‍ය සහ සම්ප්‍රදායික ක්‍රම භාවිතා කිරීම.

## හදිසි ආපදා මෙහෙයුම්

- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඕනෑම ආපදා අවස්ථාවකදී ප්‍රතිචාර දැක්වීම සඳහා ත්‍රිවිධ හමුදා, පොලිසිය ඇතුළු සියලු ආයතන සම්බන්ධීකරණය කරනු පිණිස සතියේ දින හතේම පැය 24 පුරාම (24x7) ක්‍රියාත්මක හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය (EOC) පිහිටුවා ඇත. ඕනෑම අවස්ථාවකදී හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයේ සහය ලබා ගැනීමට 011-2670002 යන අංකය ඇමතිය හැකිය.
- දිස්ත්‍රික් මට්ටමේ හදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන (EOCs) විශාල ව්‍යසනයකදී ක්‍රියාත්මක වේ.
- හානියට පත් ජනතාව ඉවත් කිරීම, සෙවීමේ හා ගලවා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම, සුභසාධන මධ්‍යස්ථාන කළමනාකරණය කිරීම, සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් පවත්වා ගැනීම සහ පිසූ ආහාර බෙදා දීම සම්බන්ධීකරණය කරනු පිණිස ග්‍රාම නිලධාරි කොට්ඨාසය මට්ටමින් කමිටු පිහිටුවනු ලැබේ.
- හානියට පත් සේවාවන් ප්‍රකෘතිමත් කරනු පිණිස උපයෝගිතා සේවා සම්පාදකයින් සමග හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය (EOC) සම්බන්ධ වෙයි.
- මාධ්‍ය සමග සම්බන්ධ වී, හදිසි ආපදා තත්ත්වය ගැන නිතිපතා නිවේදන නිකුත් කරයි.



# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

## ආපදා කළමනාකරණ අමාත්‍යාංශය



"වඩා සුරක්ෂිත ශ්‍රී ලංකාවක් කරා......"


අධ්‍යක්ෂ ජනරාල්,
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය,
විද්‍යා මාවත, කොළඹ 07.

| | | |
|---|---|---|
| දුරකථන | - | 011-2136136, 011-2670002, 077-3957900 |
| ෆැක්ස් | - | 011-2670079, 011 - 2670025 |
| ඊ-මේල් | - | info@dmc.gov.lk |
| වෙබ් | - | www.dmc.gov.lk |
| | - | DMC Srilanka |
| | - | DMC-Sri Lanka |


**හදිසි ඇමතුම් 117**

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවීම හා එහි කර්තව්‍යයන්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතට අනුව ආපදා කළමනාකරණය සඳහා වන ජාතික සභාවට පවරා ඇති යම් කර්තව්‍යයන්වලට සහාය වනු පිණිස ස්ථාපිත කොට ඇත.

- ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සහ ජාතික හදිසි ආපදා ප්‍රතිචාර සැලැස්ම පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ජාතික සැලැස්ම මත පදනම්ව, ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම පිළියෙල කර ගැනීමට අමාත්‍යාංශවලට, රජයේ දෙපාර්තමේන්තුවලට හා සංස්ථාවලට සහය වීම.
- ආපදා පෙරසූදානම්, හානි අවම කිරීම්, වැළැක්වීම්, සහන, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා සහය වීම.
- එබඳු වැඩසටහන් හා සැලසුම් ක්‍රියාත්මක කරන සංවිධානයන් සම්බන්ධීකරණය කිරීම, එබඳු ක්‍රියාකාරකම් සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් මූල්‍ය උපකාර ලබා ගැනීම, එම මුදල් අදාළ ප්‍රදේශ සඳහා මුදා හැරීම සහ මෙම කටයුතු නිරීක්ෂණය කිරීම හා ඇගයීම..
- පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ ආපදා කළමනාකරණය පිළිබඳ දත්ත සමුදායක් ඇති කොට පවත්වා ගෙන යාම.

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සංවිධාන ව්‍යුහය

අධ්‍යක්ෂ ජනරාල්වරයා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සමස්ථ කළමනාකරණය සඳහා වගකීම දරයි. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් පිළිබඳ සමස්ත සම්බන්ධීකරණය හා නිරීක්ෂණය සඳහා වගකිව යුතු වේ. හදිසි ආපදා මෙහෙයුම්, පෙරසූදානම් හා මහජන දැනුවත් කිරීම සැලසුම් කිරීම, හානි අවම කිරීම, පර්යේෂණය හා සංවර්ධනය සහ මූල්‍ය හා මානව සම්පත් යන අංශ පහේ එක් එක් අංශය අධ්‍යක්ෂවරයකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙක් හා සහකාර අධ්‍යක්ෂවරුන් කීප දෙනෙක් ඔහුට සහාය වෙති.

එක් එක් දිස්ත්‍රික්කයෙහි ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයක් පිහිටුවා ඇත. දිස්ත්‍රික් ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියා කරන සහකාර අධ්‍යක්ෂවරයා දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරයි.

### දැක්ම

"දැනුම්වත් වී සුරක්ෂිත වූ ප්‍රජාවන්."














### මෙහෙවර

"ස්වාභාවික, තාක්ෂණික හා මිනිසා මුල් වූ ව්‍යසන ක්‍රමානුකූලව කළමනාකරණය කිරීම තුළින් ප්‍රජාව අතරත්, පොදුවේ ජාතිය තුළත් සුරක්ෂිත සංස්කෘතියක් බිහිකර එය තිරසාර කිරීම."

## ආපදා අවම කිරීම, පර්යේෂණ හා සංවර්ධනය

- 1974 සිට ඓතිහාසික ආපදා තොරතුරු www.desinventar.lk යන වෙබ් අඩවියේ ඇත.
- නායයාම්, නියඟ, මුහුදු රළපහර, සුනාමි, සුළිසුළං, අකුණු, ජලගැලීම්, වෙරළ ඛාදනය සහ මුහුදු මට්ටම ඉහළ යාම් පිළිබඳ උපද්‍රව විස්තර www.hazard.lk යන වෙබ් අඩවියේ ඇත.
- උපද්‍රව සහගත ප්‍රදේශයන්හි නිවාස ඉදිකිරීම සඳහා වූ මාර්ගෝපදේශ සංවර්ධනය කරනු ලැබේ.
- සංවර්ධන ආයතනයන්ට සිය සැලසුම් තුළට ආපදා ප්‍රතිචාරය අන්තර්ග්‍රහණය කර ගැනීමට සහාය වීම.
- හඳුනාගත් උපද්‍රව සඳහා අවදානම් ස්වරූපය පිළියෙල කිරීම.
- ආපදා ප්‍රතිචාර පර්යේෂණ හා අධ්‍යයන ප්‍රවර්ධනය කිරීම

## පෙර සූදානම් හා සැලසුම්

- ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සහ ජාතික හදිසි ආපදා මෙහෙයුම් සැලැස්ම සම්පූර්ණ කර ඇත.
- සියළු දිස්ත්‍රික්ක සඳහා ආපදා පෙර සූදානම් සැලැස්ම සකස් කර ඇත.
- දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාම නිලධාරි කොට්ඨාස, පාසල් සහ රෝහල් ආශ්‍රිතව ආපදා පෙර සූදානම් හා ප්‍රතිචාර සැලැස්ම සංවර්ධනය කිරීමට පහසුකම්, මග පෙන්වීම හා සම්බන්ධීකරණය සැපයීම.
- ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීමට රාජ්‍ය ආයතනයන්ට සහාය වීම.
- දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමේ කමිටුවල විභව්‍ය ව්‍යසනවලට ප්‍රතිචාර දැක්වීමේ ධාරිතාවය ශක්තිමත් කිරීම.
- ව්‍යවසනවලට මුහුණ පෑමට ඉඩ ඇති අය යොමු කිරීම සඳහා ආරක්ෂිත ස්ථාන හඳුනාගැනීම හා ප්‍රජාවන්හි හා පාසල් සිසුන්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමට පෙරහුරු පැවැත්වීම.
- උපද්‍රව සහගත ප්‍රදේශයන්හි පළාත් පාලන ආයතනවල දරා ගැනීමේ ධාරිතාව අඛණ්ඩව සංවර්ධනය කිරීම.